සැ. යු. — 2013.02.01 දින පළ වූ අංක 1,796 දරන ගැසට් පත්‍රයේ III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,797 - 2013 පෙබරවාරි 08 වැනි සිකුරාදා - 2013.02.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහේස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 378 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා සියලු ම දැන්වීම් භාරගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 මාර්තු මස 01 වැනි දින පළ කෙරෙන ගැසට් පත්‍රයේ දැන්වීම් 2013 පෙබරවාරි මස 15 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
*රජයේ මුද්‍රණාලයාධිපති (වැ. බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# විවිධ දැන්වීම්

## කේ. ඩී. එම්. චන්ද්‍රා බණ්ඩාර ප්‍රජා සත්කාර පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

චන්ද්‍රානි බණ්ඩාර ජයසිංහ වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 48 දරන ස්ථාවර නියෝගය යටතේ "කේ. ඩී. එම්. චන්ද්‍රා බණ්ඩාර ප්‍රජා සත්කාර පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි" යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථ වලින් යුක්ත වන්නා වූ එකී පදනම සංස්ථාගත කිරීමයි :–

1. ජාතීන් අතර සමගිය හා සාමය වර්ධනය කිරීම ; සහ

2. ජනතාව එදිනෙදා මුහුණපාන සෞඛ්‍ය ගැටලු සහ නීතිමය ගැටලුවලින් ඔවුන් වෙත සහන ලබාදීමට කටයුතු කිරීම ;සහ

3. අන්තර් ජාතික සබඳතා ගොඩනැගීම තුළින් ආර්ථික, දේශපාලනික, අධ්‍යාපනික, සංස්කෘතික, සමාජයීය යන ක්ෂේත්‍ර තුළ අභිවෘද්ධියක් ඇති කිරීම සහ ඒ සම්බන්ධව දැනුම සහ අවබෝධය වැඩි කිරීම,

යනාදිය වේ.

චන්ද්‍රානි බණ්ඩාර ජයසිංහ,
පාර්ලිමේන්තු මන්ත්‍රී.

02-286

---

### අධිකරණ බලය (වාණිජ) ක්‍රියාත්මක කිරීමෙහිලා කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාතේ මහාධිකරණයේ දී ය

රණාල අවිස්සාවේල්ල පාර, අලුත්ගෙදර වත්ත පිහිටි, සුපර් ඇපරල් ගෲප් (ප්‍රයිවෙට්) ලිමිටඩ් පිළිබඳ කාරණයේ දී ය.

ගණන් බේරා වසා දැමීමේ ඉල්ලුම්පත් අංකය : 49/2012 CO

සහ

2007 අංක 07 දරන සමාගම් XII වැනි කොටස යටතේ අධිකරණය විසින් ගණන් බේරා වසා දැමීම සඳහා වූ ඉල්ලීම පිළිබඳ කාරණයේ දී ය.

සුපර් ඇපරල් ගෲප් (ප්‍රයිවෙට්),
අලුත්ගෙදර වත්ත,
අවිස්සාවේල්ල පාර,
රණාල.

ඉහත නම් සඳහන් සමාගම සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාතේ මහාධිකරණය විසින් ගණන් බේරා වසා දැමීම සඳහා රණාල, අවිස්සාවේල්ල පාර, අලුත්ගෙදර වත්ත, සුපර් ඇපරල් ගෲප් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් වර්ෂ 2012ක් වූ නොවැම්බර් මස 30 වැනි දින පෙත්සමක් ඉදිරිපත් කර ඇති බවත්, එකී පෙත්සම වර්ෂ 2013 පෙබරවාරි මස 22 වැනි දින අධිකරණය ඉදිරියේ දී විභාග කිරීමට විධාන කෙරුණු බවත්, එම පෙත්සමට අදාලව නියෝගයක් කිරීමට පක්ෂව හෝ විරුද්ධව කරුණු සැලකර සිටීමට අපේක්ෂා කරන එකී සමාගමේ ණය හිමියන් හෝ සහදායකයෙක් වේ නම් ඒ සඳහා තමාව හෝ සිය නීති උපදේශකවරයා හෝ නීතිඥවරයා මගින් එම විභාගය පවත්වන අවස්ථාවේ දී පෙනී සිටිය හැකි බවත් එකී පෙත්සමේ පිටපතක් ලබා ගැනීම සඳහා නියමිත ගාස්තුව ගෙවූ විට එහි පිටපතක් අවශ්‍ය කරන එකී සමාගමේ යම් ණය හිමියෙකුට හෝ සහදායකයෙකුට පහත අත්සන් කරන අය විසින් සපයනු ලබන බවත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

පී. සී. ගුණවර්ධන,
ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස්,
අංක 15,
ස. ණ. ස. නීතිඥ කාර්යාල සංකීර්ණය,
ගම්පහ

සටහන.-එකී පෙත්සම විභාග කරන අවස්ථාවේ දී පෙනී සිටීමට අදහස් කරන කිසිවෙකු වෙතොත් එසේ කිරීමට තමා අදහස් කරන බවට ලිඛිත නිවේදනයක් ඉහත නම් සඳහන් නීතිඥවරයා වෙත ගෙනැවිත් බාර දිය යුතු හෝ තැපෑලෙන් එවිය යුතු වේ. එම නිවේදනයේ එම අයගේ නම හා ලිපිනය හෝ ව්‍යාපාරික ආයතනයක් වේ නම් එම ව්‍යාපාරික ආයතනයේ නම හා ලිපිනය ද සඳහන් කොට එම අය විසින් හෝ එම ව්‍යාපාරික ආයතනය විසින් හෝ ඔවුන්ගේ නීතිඥවරයෙකු වෙතොත් ඔහු විසින් අත්සන් කොට ඉහත නම් සඳහන් අය වෙත වර්ෂ 2013ක් වූ පෙබරවාරි 21 වැනි දින පස්වරු 6.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ ගෙනැවිත් භාරදිය යුතු ය ; නැතහොත් එපරිදි තැපෑලෙන් එවිය යුතු ය.

පී. සී. ගුණවර්ධන,
පෙත්සම්කරුගේ ලේඛනගත නීතිඥ.

02-323

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.